# සුකිරි සහ තවත් කතා




ජී.එච්. අක්ෂාරා ආදිත්‍යනී රණවීර

# සූකිරි සහ තවත් කතා

ජී.එච්. අක්ෂාරා ආධිත්‍යානි රණවීර

# සූකිරි සහ තවත් කතා


## ජී.එච්. අක්ෂාරා ආධිත්‍යනී රණවීර


### කර්තෘගේ වෙනත් කෘති :

### පළමු දිගහැරීම

| | |
|---|---|
| පාසල | : මහ/ස්වර්ණමාලි බාලිකා විදුහල |
| ඉගෙනුම ලබන පංතිය | : **03 ශ්‍රේණිය** |
| කෘතිය පල කරන දිනය | : **25.04.2026** |


**ISBN** අංකය : **978-624-211-003-5**

# පිදුම

මේ පොත් පිංච සෑදීමට මට උපකාර කළ

ආදරණීය අම්මාටත්, අප්පච්චීටත්,

අක්කලා දෙන්නටත්, අත්තම්මලාටත්,

පවුලේ සැමදෙනාටත්,

විශේෂයෙන් මහනුවර ස්වර්ණමාලි බාලිකා විදුහලේ

ගරු විදුහල්පතිතුමිය ඇතුළු ගුරු මෑණිවරුන්ටත්,

පියවරුන්ටත්,

මහමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමියටත්,

සේනාරත්න ගුරු පියාණන්ටත්,

ගුරුහරුකම් ලබා දෙමින් මග පෙන්වන

සිසිර සීයාටත්

සතුටු සිතින් පුදමි...

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය ,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,  
දියවඩන නිලමේ,  
ශ්‍රී දළදා මාලිගාව  
2026.05.10

# පටුන


| | පිටු අංක |
|---|---|
| 1. සූකිරි සහ කතා කරන කුරුල්ලා | 1 - 5 |
| 2. රතු සපත්තුව | 6 - 9 |
| 3. රෝස කුමරිය සහ නපුරු කුමරිය | 10 - 12 |
| 4. බැග් හොරා | 13 - 16 |

# සූකිරි සහ කතා කරන කුරුල්ලා



ඔන්න එක ගමක හිටියා හරිම හොඳ පවුලක්. මේ පවුලේ ජීවත් වුණේ අම්මයි තාත්තයි සූකිරි කියලා ළමයෙකුයි. ඉතින් ඔන්න සූකිරි ගියා එයාගෙ යාළුවත් එක්ක සෙල්ලම් කරන්න කියලා සූකිරිගේ ගෙදර පැත්තට. ඇතදීම සූකිරි දැක්කා යාළුවා සෙල්ලම් කරනවා. හැබැයි කවුරුත් පේන්න නෑ කුරුල්ලෙක් එක්ක තමයි එයා සෙල්ලම් කරන්නේ. අනේ ! ඒ කුරුල්ලාට කථා කරන්නත් පුළුවන්. සූකිරිට පුදුමයි.



සූකිරි ඒවා දැක්කෙ නෑ වගේ යාළුවා ළඟට ගිහින් ඇහුවා. ඔයා කථා කර කර සෙල්ලම් කරන්නේ කාගෙත් එක්කද කියලා. යාළුවා කිවුවා මගෙත් එක්ක සෙල්ලම් කරන මේ කුරුල්ලත් එක්ක කියලා. අනේ එයා සෙල්ලම් කුරුල්ලෙක්. මටත් මේ වගේ කථා කරන සෙල්ලම් කුරුල්ලෙක් හිටියනම් මට තනියම සෙල්ලම් කරන්න පුළුවන්නේ කියලා හිතුනා. එදා දවසෙ සූකිරි සෙල්ලම් කරලා ගෙදර ගියා. ඊට පසු ඊළඟ දවස උදා වුණා. සූකිරි පාසල් යන්න ලෑස්ති

වුණා. අම්මා සූකිරිට කතා කළා. සූකිරි අම්මා ළඟට ආවා. අම්මා සූකිරිට සල්ලි දුන්නා කෑම ගන්න කියලා. සූකිරි සතුටින් පාසල් ගියා. එයා කෑම ගන්නෙ නැතිව ඒ සල්ලිවලින් කථා කරන කුරුල්ලෙක් ගත්තා. කාටවත් පෙන්නන්නෙ නැතිව කුරුල්ලත් අරගෙන ඉස්කෝලෙ ඇරිලා ගෙදර ආවා.

සූකිරි කථා කරන කුරුල්ලත් එක්ක කාමරයට වෙලා සෙල්ලම් කළා. සූකිරිගේ අම්මාට ඇහුණා.



සූකිරි කාගෙත් එක්ක හරි කථා කර කර සෙල්ලම් කරනවා. අම්මා සූකිරිට කිවුවා දොර අරින්න කියලා. සූකිරි දොර ඇරියා. අම්මා ඇහුවා කාගෙත් එක්කද කථා කර කර හිටියෙ කියලා. මම තනියම කථා කර කර හිටියෙ කියලා අම්මට සූකිරි බොරුවක් කිවුවා. අම්මා යන්ට ගියා. ඊළඟ දවස උදා වුණා. පාසල් යන්ට ලෑස්ති වුන සූකිරිගෙන් ඇහුවා ඊයෙ දීපු සල්ලිවලට මොකද කලේ කියලා. කෑම ගත්ත කියලා සූකිරි බොරු කිවුවා. සූකිරි පාසල් ගියා. අම්මා සූකිරිගෙ කාමරය අස් කරන්න යද්දි ඇඳ ළඟ කුරුල්ලෙක් ඉන්නවා. අම්මා ඒ කුරුල්ලා ගත්තා. සූකිරි ඉස්කෝලෙ ඇරිලා ඉක්මනින් ම ගෙදර ඇවිත් කාමරයේ දොර වහගෙන සෙල්ලම් කරන්ට කියලා හිතාගෙන කථා කරන කුරුල්ලා තියල තිබුණ තැනට ගියා. එතන කුරුල්ලා නෑ. කාමරය හැම තැන ම හෙවුවා. සූකිරිට හොඳටම දුක හිතුණා. එතකොටම අම්මා සූකිරිට කතා කළා. මේ කුරුල්ලා කාගෙද කියලා සූකිරිගෙන් අම්මා ඇහුවා. සූකිරි මොකවත් කියන්නෙ නැතිව හිටියා. අම්මා දැනගත්තා සූකිරි කෑම ගන්නෙ නැතිව ඒ සල්ලිවලින් කුරුල්ලා

අරගෙන කියලා. සූකිරි බිම බලාගෙන බයවෙලා හිටියේ. අම්මා කිවුවා කමන්නෙ නෑ ඒක වැරැද්දක් කියලා ඔයා පිළිගන්නවනම් ආය වැරදි කරන්ට එපා කියලා සූකිරිට අම්මා කිවුවා.




# රතු සපත්තුව



ඔන්න එක ගමක හිටියා පවුලක්. ඒ පවුලේ හිටියේ අම්මයි, තාත්තයි, ලස්සන කවීෂා කියලා දුවෙක්. ඔන්න අද දුවගෙ උපන්දිනේ. ඔන්න ඉතින් දුව ආසම රතු සපත්තු දෙකකට. ඉතින් දුවගෙ උපන්දිනය දවසෙ රතු සපත්තු දෙකක් තෑගි ලැබුණා. දුව ආසාවෙන් තෑග්ග ගත්තා.



තෑගි පෙට්ටිය ඇරලා බැලුවහම එයා ආසම රතු සපත්තු දෙකක්. එයා ඒ සපත්තු දෙක කකුලට දාලා බැලුවා. ඒ සපත්තු දාගෙන ඉන්න බෑ නිකම්ම දිවෙනවා.



හැබැයි, මේ සපත්තු දෙක දා ගන්න කවීෂත් අරගෙන ගියේ තව රතු සපත්තු ගොඩක් තියෙන තැනකට. එතන හිටියා කුමාරිකාවක්. කුමාරිකාව කිවුවා ඔයාට ඕන තරම් සපත්තු අරගන්ට කියලා.



ඒත් කවීෂ කිවුවා අම්මටයි, තාත්තටයි, මටයි සපත්තු කුට්ටම් තුනක් ඇති කියල. කුමාරිකාව කිවුවා මම හිතාගෙන හිටියෙ තණ්හාවට කැමති අයට එක සපත්තුවක්වත් දෙන්නෙ නෑ තණ්හාව නැති අයට තමයි මම සපත්තු දෙන්නේ කියලා. ඒ හින්දා කවීෂ

තණ්හාව නැති ළමයෙක් නිසා ඔයාට සපත්තු ගොඩක් දෙනව කියලා සපත්තු ජෝඩු දෙකක් දුන්නා. ඉතින් කවීෂගෙ පවුල ඔන්න ඔහොමයි ජීවිතේ ගත කළේ.

# රෝස කුමරිය සහ නපුරු කුමරිය




ඔන්න එක ගමක ගෙවල් දෙකක ජීවත් වුණ පවුල් දෙකක් හිටියා. එක ගෙයක රෝස කුමරිය කියලා හොඳ කුමාරිකාවක් හිටියා. අනිත් ගෙදර නපුරු කුමාරිකාවක් තමයි ජීවත් වුණේ. ඉතින් මේ රෝස කුමරිය ලස්සන රෝස පාට මල් පෝච්චියක් ගේ ඉස්සරහින් තිබ්බා.



අර නපුරු කුමරිය හොරෙන් ම අර මල් පෝච්චිය අරගෙන එයාට තිබුණ බලයක් පාවිච්චි කරලා දම් පාට කළා. ඒක එයාගෙ කියල කියා ගත්තා. මේක රෝස කුමරිය දැක්කා රෝස කුමරිය එයාට තිබුණ බලයක් පාවිච්චි කරලා අර මල් පෝච්චිය කළු පාට කළා.



ඒක අර නපුරු කුමරිය දැකලා මේකට නපුරු කුමරියට තරහ ගිහිල්ලා රෝස කුමරියට හොඳටම බැන්නා. රෝස කුමරිය නරක වැඩ කළොත් වෙන දේ ගැන අර දුෂ්ඨ කුමරියට කියලා දුන්නා. ඊට පස්සෙ දුෂ්ඨ කුමරියත් හොඳ කුමාරිකාවක් වෙලා දෙන්නම සතුටින් ජීවත් වුණා.




# චිචි

එකෝමත් එක් කාලෙක රිලවෙක් හිටියා. එයා ඉපදිලා ටික දවසකින් එයාගෙ අම්මා මැරුණා. එයා හිටියේ සත්තු වත්තෙ. එයාට චිචි කියලයි ඔක්කොම අය කථා කලේ.



මේ රිලා පැටියා තනියම හිටපු නිසා එයාට රිලා ටෙඩියෙක් දුන්නා. මේ ටෙඩිබෙයත් එක්ක සෙල්ලම් කරපු චිචිට හිතුණා, මේ තමයි මගේ අම්මා කියලා. ඒ

ටෙඩිබෙයාගේ අතකින් අල්ලාගෙන මේ ච්ච් හැම තැනම ඇවිදිනවා. රිලා රංචුවේ හිටපු අනෙක් රිලවු කවුරුත්ම එයත් එක්ක ආවේ නෑ. රිලා රංචුවේ කවුරුත් ච්චිත් එක්ක යාළු නෑ කියලා එයා හරිම දුකින් ටෙඩිබෙයත් එක්කම හිටියා.



හැබැයි එයාට එක යාළුවෙක් හිටියා. ඒ තමයි ඒ සත්තු වත්තේ අයිතිකාරයා. දැන් එයාට යාළුවෝ එක්කනයි ටෙඩිබෙයා අම්මයි ඉන්න නිසා එයාල දෙන්නත් එක්ක තමයි කථා කරන්නේ.

එක දවසක් සත්තු වත්තෙ අයිතිකාර යාළුවා දීපු කෑමක් අරගෙන ගලක් උඩ ඉඳගෙන මේ චිචි කෑම කනවා. මේක දැකපු ලොකු රිලවෙක් ඇවිත් එයාගෙ කෑම උදුරගෙන එයාට කරදර කළා. අනෙක් රිලවු එක්කෙනෙක්වත් මේ චිචිව බේරගන්න ආවෙ නෑ. මේ විදිහට චිචිට හැමදාම රිලා රංචුවේ කවුරු හරි කරදර කරනවා. මේ විදිහට ටික දවසක් ගෙවුණා. ඒ කරදර වලින් බේරෙන්න හැම තැනම දිවුවා. අන්තිමට එයා දුවගෙන ටෙඩිබෙයා අම්මා ගාවට ගිහිල්ලා හැංගෙනවා. බයක් හිතුන ගමන් චිචි ටෙඩිබෙයා අම්මා ගාව හැංගෙනවා. එයා සෙල්ලම් කරන්නෙත් මේ ටෙඩිබෙයා අම්මාත් එක්ක විතරයි. මේ විදිහට ඉන්නකොට මෙයාට හිතුනා අනිත් අයත් එක්ක කොහොම හරි යාළුවෙක්ට ඕන කියලා. එයාල ළඟට ගියා. ඒත් ඒ ඔක්කොම මේ චිචි එලෙවුවා, තල්ලු කළා. මෙයාට කවුරුවත්ම ආදරේ කළේ නෑ. මේක දැකපු චිචිගෙ යාළුවාට දුක හිතුණා. ඊට පස්සේ අයිතිකාර යාළුවා මේ සත්තු වත්තට තව ලොකු රිලවෙක්ව ගෙනාවා. ඒ ලොකු රිලවට අනෙක් රිලා රංචුවේ අය

කරදර කළා. මේක දැකපු චිචි මේ ලොකු රිලවා ළඟට ගිහින් මූණ අත ගෑවා. ඇඟ අත ගෑවා. ඊට පස්සෙ ටික දවසක් යනකොට මේ දෙන්නා හොඳ යාළුවෝ වුණා. මේ චිචිට කෑම කවනවා. හොඳටම සන්තෝෂයි. මේ ලොකු රිලවා චිචිව අම්මෙක් වගේ බලා ගන්නවා. දැන් මේ චිචිට සත්තු වත්තට බලන්ට එන ඔක්කොමත් ආදරෙයි. දැන් චිචි සතුටින් ඉන්නවා. එයාට දැන් අම්ම කෙනෙක් හම්බ වුණ නිසා චිචි හරිම සතුටින් ජීවත් වුණා.

# ස්තූතිය

මෙම පොත සෑදීමට මා හට උදව් කළ ආදරණීය අම්මාටත්, අප්පච්චිටත්, ලොකු අක්කාටත්, පොඩි අක්කටත්, මගේ ස්වර්ණමාලි බාලිකා විදුහලේ විදුහල්පතිනියටත්, ගුරුමෑණීවරුන්ටත්, අත්තම්මලාටත්, සිසිර ගමගේ සීයාටත් ස්තූතියි...

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂ්‍යයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිශීලනය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමෙතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)